Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

# ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
## (බාහිර) - 2009

## සමාජීය විද්‍යා පීඨය

## පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC - E1025

### පුස්තකාල, ඒවායේ සේවා, එකතු සංවර්ධනය හා කළමනාකරණය

<u>ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි      කාලය : පැය 03 යි

---

01. (i) ජාතික පුස්තකාල අනෙකුත් පුස්තකාලවලට වඩා වෙනස් වන්නේ කෙසේදැයි පහදන්න. (ලකුණු 07)

(ii) ජාතික පුස්තකාලයකින් ඉටු කැරෙන ග්‍රන්ථ විද්‍යාත්මක සේවාවන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ආශ්‍රයෙන් විස්තර කරන්න. (ලකුණු 13)

02. ග්‍රන්ථයක් පුස්තකාලයකට ලබා ගැනීමේ සිට එය රාක්කගත කිරීම දක්වා අනුගමනය කරන ක්‍රියාවලිය පියවරින් පියවර සැකෙවින් දක්වන්න.

(ලකුණු 20)

03. දියුණු වෙමින් පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශකයන් මුහුණපාන ගැටළු පිළිබඳ ගවේෂනයක් කරන්න.

(ලකුණු 20)

04. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල වර්තමානයේ මුහුණපාන ප්‍රධාන අභියෝගයක් වන්නේ මූල්‍ය ඌනතාවය ඇතුළු සම්පත්වල හිඟකමයි. මෙම තත්ත්වයට මුහුණදීම සඳහා මහජන පුස්තකාල සඳහා භාවිතා කළ හැකි අන්තර් පුස්තකාල සහයෝගීතා ක්‍රම මොනවා දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

05. (i) එකතු සංවර්ධන ප්‍රතිපත්ති ප්‍රකාශනයක මූලිකාංග කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමෙන් පුස්තකාලයකට ලැබෙන ප්‍රතිලාභ විස්තර කරන්න.

(ලකුණු 10)

06. (i) ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය (Acquisition) යනු කුමක්ද?

(ලකුණු 06)

(ii) ග්‍රන්ථ ප්‍රතිග්‍රහණ ක්‍රම නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 14)

07. පහත සඳහන් මාතෘකා අතුරින් හතරක් (04) පිළිබඳ සටහන් ලියන්න.

(i) ප්‍රවේශ ලේඛනය හා එහි ශීර්ෂ
(Accession Register and its headings)

(ii) පොත් බැඳීම

(iii) බ්‍රවුන් ක්‍රමය

(iv) සක්‍රිය ප්‍රලේඛන ක්‍රම

(v) පොත් තේරීමේ මූලාශ්‍ර

(ලකුණු 05 බැගින්)